12 FEB 2019

**මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තුවේ ක්‍රීඩා නිලධාරීන්ගේ ඒකාබද්ධ සේවයේ කළමනාකරණ සහකාර අධි ශ්‍රේණියේ දිස්ත්‍රික් ක්‍රීඩා නිළධාරී තනතුර සඳහා වන බඳවා ගැනීමේ පරිපාටිය.**

**1.** සම්බන්ධ වන ආයතන.

**1.1.** දෙපාර්තමේන්තුව :මධ්‍යම පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තුව
යොමු අංකය :CPC/SD / 03 දිනය : 2018.07.03

**1.2.** අමාත්‍යාංශය :මධ්‍යම පළාත් ක්‍රීඩා විෂය භාර අමාත්‍යාංශය
යොමු අංකය :CPC/MI/HRM/11/8/6 දිනය : 2018.07.03

**1.3.** මධ්‍යම පළාත් ප්‍රධාන ලේකම්ගේ නිර්දේශය:
යොමු අංකය :CPC/CS/2/3/S.M/I (III) දිනය : 2018.07.18

**1.4.** කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුරු අනුමත කිරීම
යොමු අංකය :DMS/CP/0319 දිනය : 2018.06.28

**1.5.** ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය:
යොමු අංකය :NSCC/10/71/5/SR දිනය : 2018.10.29

**2.** ක්‍රියාත්මක දිනය : මෙම පරිපාටිය මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරනු ලබන දින සිට ක්‍රියාත්මක වේ.

**3.** පත් කිරීම් බලධරයා : මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

**4.** සේවා ගණය පිළිබඳ විස්තර

**4.1.** සේවා ගණය : කළමනාකරණ සහකාර - අධි

**4.2.** ශ්‍රේණි : අධි

**4.3.** පැවරෙන කාර්ය භාරය පිළිබඳ පොදු නිර්වචනය:

අනුමත තනතුරු සංඛ්‍යාවට සීමා වන පරිදි අභ්‍යන්තර බඳවා ගැනීමේ ක්‍රියාවලියක් මගින් බඳවා ගනු ලබන ජ්‍යෙෂ්ඨ විධායක හා විධායක නිලධාරීන්ගේ කාර්යභාරයට පරිපූරක / සුසාධ්‍යකාරක / උපස්ථම්භක වන පරිදි එම නිලධාරීන්ගේ අධීක්ෂණයට යටත්ව තනතුරු විශේෂිත කොට පවරා දෙනු ලබන පරිපාලනමය / පිරිස් කළමනාකරණ සහ මූල්‍ය කළමනාකරණ කාර්යයන් පැවරෙන නිලධර ගණයකි.

**4.4.** කාර්යයන් පැවරීම

මෙම සේවා ගණයට පැවරෙන කාර්යයන් අතුරින් ඕනෑම කාර්යයක් සේවයේ අවශ්‍යතාවය මත ආයතන ප්‍රධානියා විසින් පවරනු ලැබිය හැක.

**5.** තනතුරෙහි / තනතුරුවල ස්වභාවය: ස්ථිර විශ්‍රාම වැටුප් සහිතය.

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2019.01.31 දින
අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්

6. වැටුප්

**6.1.** වැටුප් කේත අංකය : MN 7 -2016

**6.2.** වැටුප් පරිමාණය : රු. 41580 – 11 x 755 – 18 x 1030 = රු. 68425/-

**6.3.** ශ්‍රේණි ක්‍රමය හා ශ්‍රේණි ක්‍රමයට අදාළ මාසික වැටුප් පියවර:

| ශ්‍රේණිය | ආරම්භක වැටුප් පියවර | වැටුප් තලය (රු.) |
|---|---|---|
| අධි | 04 | 43845/- |

**6.4.** වැටුප් ගෙවීම් හා අනෙකුත් කරුණු රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 හි විධිවිධාන අනුව සිදු කරනු ලැබේ.

7. සේවා ගණයට අයත් තනතුර / තනතුරු

**7.1.** අනුමත තනතුරු නාම, අනුමත තනතුරු සංඛ්‍යාව හා ඒවාට පැවරෙන කාර්යයන්:

| අනුමත තනතුරු නාම | තනතුර අනුමත ශ්‍රේණිය | අනුමත තනතුරු සංඛ්‍යාව | කාර්යයන් |
|---|---|---|---|
| දිස්ත්‍රික් ක්‍රීඩා නිලධාරි | අධි ශ්‍රේණිය | 04 | 1 තම ක්‍රීඩා පරිපාලන දිස්ත්‍රික්කයේ ක්‍රීඩා නිලධාරීන් හා පුහුණුකරුවන්ගේ මාණ්ඩලික නිලධාරි වශයෙන් අධීක්ෂණය භාරව කටයුතු කිරීම හා කාර්ය සාධනය ඇගයීම.<br>2 දිස්ත්‍රික් මට්ටමේ ක්‍රීඩා සංවර්ධනය සඳහා සැලසුම් සකස් කිරීම ක්‍රියාත්මක කිරීම.<br>3 ප්‍රාදේශීය ක්‍රීඩා සංවර්ධනය සඳහා සකස් කරන ලද සැලසුම් ප්‍රාදේශීය මට්ටමින් ක්‍රියාත්මක කිරීම සඳහා ක්‍රීඩා නිලධාරීන් මෙහෙය වීම පූර්ණ අධීක්ෂණය හා කළමනාකරණය.<br>4 පුහුණුකරුවන්ගේ වාර්ෂික සැලසුම් ක්‍රියාත්මක කිරීම සඳහා ඔවුන් මෙහෙය වීම පූර්ණ අධීක්ෂණය හා කළමනාකරණය.<br>5 දිස්ත්‍රික් මට්ටමේ ප්‍රාදේශීය අන්තර් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ තරඟාවලියට අදාළව කණ්ඩායම් ක්‍රීඩා තරඟ හා මළල ක්‍රීඩා තරඟ ඉසව් සංවිධානය කර පැවැත්වීම හා එමඟින් පළාත් මට්ටමේ අන්තර් දිස්ත්‍රික් තරඟ සඳහා සුදුස්සන් තෝරා ගැනීම. |

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2019.01.31 දින
අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්

| | | | |
|---|---|---|---|
| | | | 6 ක්‍රීඩා නිලධාරී හා පුහුණුකරුවන් විසින් පවත්වාගෙන යනු ලබන ක්‍රීඩා පුහුණු මධ්‍යස්ථානවල ක්‍රියාකාරීත්වය කළමනාකරණය අධීක්ෂණය හා දිස්ත්‍රික් ක්‍රීඩා පුහුණු කඳවුරු ඵලදායි ලෙස සංවිධානය සඳහා වැඩසටහන් සම්පාදනය කිරීම.<br>7 පළාත් අන්තර් දිස්ත්‍රික් ක්‍රීඩා තරඟ සඳහා ක්‍රීඩක ක්‍රීඩිකාවන් යොමුකිරීම සඳහා නිලධාරීන් මෙහෙය වීම.<br>8 ක්‍රීඩා නිලධාරීන්ගේ හා පුහුණුකරුවන්ගේ මාසික ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම.<br>9 ක්‍රීඩා නිලධාරී පුරප්පාඩු කොට්ඨාශ වල වැඩ ආවරණය සඳහා සුදුසු නිලධාරීන් යෙදවීමට කටයුතු කිරීම.<br>10 දිස්ත්‍රික්කයේ රාජ්‍ය/රාජ්‍ය නොවන ආයතනවල නිලධාරීන්ගේ හා පොදු ජනතාවගේ ශරීර සුවතාව වර්ධනය කිරීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් හා ප්‍රායෝගික වැඩසටහන් සංවිධානය කර ක්‍රියාත්මක කිරීම.<br>11 ක්‍රීඩා නිලධාරීන්ගේ හා පුහුණුකරුවන්ගේ අත්තිකාරම් ලබා ගැනීමේ හා පියවීම් වවුචර් සහ ගමන් වියදම් ඉල්ලුම්පත් සඳහා අදාළ නිර්දේශයන් ලබාදීම.<br>12 මධ්‍යම පළාත් අමාත්‍යාංශ ලේකම් හා පළාත් ක්‍රීඩා අධ්‍යක්ෂ විසින් පවරණ වෙනත් රාජකාරී මනාව ඉටු කිරීම. |

**7.2.** ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව - 04

සටහන - මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ අවශ්‍යතාවයන්ට අනුකූල වන පරිදි කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් කලින් කලට අනුමැතිය ලබා දෙන පරිදි මෙම සේවක සංඛ්‍යාව වෙනස් විය හැක.

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2019.01.31 ..... දින
අනුමත කරන ලදී.
Bandula
ආණ්ඩුකාර ලේකම්.

**8.** බඳවා ගැනීමේ ක්‍රමය:

**8.1.** බඳවා ගන්නා ප්‍රතිශතයන්:

| ධාරාව | ප්‍රතිශතය |
|---|---|
| විවෘත | අදාළ නොවේ |
| සීමිත | 100% |
| කුසලතා | අදාළ නොවේ |

**8.2.** විවෘත බඳවා ගැනීම් : අදාළ නොවේ.

**8.3.** සීමිත බඳවා ගැනීම්

**8.3.1.** බඳවා ගන්නා ශ්‍රේණිය : අධි ශ්‍රේණිය

**8.3.2.** සුදුසුකම් :

**8.3.2.1.** අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් :

i. මධ්‍යම පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තුවේ ක්‍රීඩා නිළධාරීන්ගේ ඒකාබද්ධ සේවයේ කළමනාකරණ සහකාර තාක්ෂණ සේවා ගණයේ ක්‍රීඩා පුහුණුකරු තනතුරේ I ශ්‍රේණියේ නිළධාරියෙකු වීම.

හෝ

ii. මධ්‍යම පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තුවේ ක්‍රීඩා නිලධාරීන්ගේ ඒකාබද්ධ සේවයේ කළමනාකරන සහකාර තාක්ෂණ සේවා ගණයේ ක්‍රීඩා පුහුණුකරු තනතුරේ II ශ්‍රේණියේ වසර අටක (08) සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කරන ලද නිළධාරියෙකු වීම.

හෝ

iii. මධ්‍යම පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තුවේ ක්‍රීඩා නිලධාරීන්ගේ ඒකාබද්ධ සේවයේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණ සේවා ගණයේ ක්‍රීඩා පුහුණුකරු තනතුරේ III ශ්‍රේණියේ වසර පහ (05) ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කරන ලද නිලධාරියෙක් වීම සහ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගෙන ඇති විශ්ව විද්‍යාලයකින් ක්‍රීඩා හෝ කළමනාකරණ ක්ෂේත්‍රයට අදාළ උපාධියක් ලබා තිබීම.

**8.3.2.2.** කායික සුදුසුකම්: මධ්‍යම පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටුකිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

**8.3.2.3.** වෙනත් සුදුසුකම් :

i. අනුමත කාර්ය සාධන ඇගයීම් පරිපාටිය අනුව සුදුසුකම් පරීක්ෂා කිරීමේ දිනට පෙරාතුව වූ වසර 10 ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

ii. පූර්වාසන්න වසර 5 ක් තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

iii. අදාළ මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබාගෙන තිබීම.(2007 වර්ෂයට පෙර බඳවා ගන්නා ලද නිලධාරීන්ට අදාළ නොවේ)

iv. අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ සමත් වී තිබීම.

v. අයදුම්පත් කැඳවීමේ නිවේදනය පළකරන දිනට 8.3.2.1 යටතේ දක්වා ඇති සියලුම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුයි.

ගරු ආණ්ඩුකාරතුමා විසින් 2019.01.31 දින අනුමත කරන ලදී.

Fernando

ආණ්ඩුකාර ලේකම්

**8.4.** වයස :අදාළ නොවේ.

**8.5.** බඳවා ගැනීමේ ක්‍රමය

**8.5.1.** ලිඛිත විභාගය : අදාළ නොවේ.

**8.5.2.** වෘත්තීය පරීක්ෂණය : අදාළ නොවේ.

**8.5.3.** සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය : අදාළ නොවේ.

**8.5.4.** යෝග්‍යතාවය ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය : (විස්තරාත්මක ලකුණු ලබා දීමේ පරිපාටිය - ඇමුණුම 01)

| ලකුණු ලබාදෙන ප්‍රධාන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| අතිරේක සේවා පළපුරුද්ද | 30 | අදාළ නොවේ |
| අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 25 | |
| පුහුණුකරු තනතුරේ දක්වන ලද දක්ෂතා | 20 | |
| අමතර වෘත්තීය සුදුසුකම් | 20 | |
| සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන ලද කුසලතා | 05 | |
| එකතුව | 100 | |

* ක්‍රීඩා නිලධාරීන්ගේ ඒකාබද්ධ සේවයේ ක්‍රීඩා නිළධාරී තනතුරට බඳවා ගැනීමේදී ඉදිරිපත් කරන ලද සහතික සඳහා නැවත ලකුණු ලබා දෙනු නොලැබේ.

* සුදුසුකම් පරීක්ෂා කිරීමද යෝග්‍යතාවය ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේදීම සිදු කරනු ලබයි.

**සටහන:**

(i) ඉහත වගුවෙහි දැක්වෙන ලකුණු ලබා දෙන ප්‍රධාන ක්ෂේත්‍ර සඳහා වෙන් කර ඇති උපරිම ලකුණු ප්‍රමාණයන් ඇතුළත එක් එක් යෝග්‍යතාවය ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා විස්තරාත්මක ලකුණු පරිපාටියක් අනුමත කිරිම පත් කිරීමේ බලධරයා විසින් සිදු කරනු ඇත.

(ii) යෝග්‍යතාවය ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයෙන් ලබා ගන්නා මුළු ලකුණුවල කුසලතා අනුපිළිවෙල අනුව හා පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව අයදුම්කරුවන් මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තුවේ ක්‍රීඩා නිලධාරීන්ගේ ඒකාබද්ධ සේවයේ කළමනාකරණ සහකාර අධි ශ්‍රේණියේ දිස්ත්‍රික් ක්‍රීඩා නිළධාරී තනතුරට බඳවා ගනු ලැබේ.

**8.5.4.1.** යෝග්‍යතාවය ඇගයීමේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත් කරනු ලබන බලධරයා : මධ්‍යම පළාත් සභාවේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

**8.6.** අයදුම්පත් කැඳවීමේ ක්‍රමය: මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව මඟින් අමාත්‍යාංශ ලේකම් වෙත දැන්වීමෙන් අනතුරුව සුදුසුකම් ලත් නිළධාරීන්ගෙන් අභ්‍යන්තරව අයදුම්පත් කැඳවනු ලැබේ.

**9.** කාර්යක්ෂමතා කඩඉම් : අදාළ නොවේ.

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2019.01.31 දින
අනුමත කරන ලදී.
[signature]
ආණ්ඩුකාර ලේකම්

**10.** භාෂා ප්‍රවීණතාවය :

| භාෂාව | ලබාගත යුතු ප්‍රවීණතාව |
|---|---|
| රාජ්‍ය භාෂාව | රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යකින් සේවයට බැඳුණු නිලධාරීන් විසින් නියමිත භාෂා ප්‍රවීණතාව පරිවාස කාලය තුළ ලබා ගත යුතුය. |
| අනෙක් රාජ්‍ය භාෂාව | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 අනුව අදාළ භාෂා ප්‍රවීණතාවය ලබාගත යුතුය. |

**11.** ශ්‍රේණි උසස් කිරීම් : අදාළ නොවේ.

**12.** තනතුරුවලට පත් කිරීම : අදාළ නොවේ.

**13.** නිර්වචනය

**13.1.** "පරිපාටිය" යනුවෙන් අදහස් කරනුයේ මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තුවේ ක්‍රීඩා නිලධාරීන්ගේ ඒකාබද්ධ සේවයේ කළමනාකරණ සහකාර අධි ශ්‍රේණියේ දිස්ත්‍රික් ක්‍රීඩා නිලධාරී තනතුර සඳහා වන බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය වේ.

**13.2.** "ආණ්ඩුකාරතුමා" යනුවෙන් අදහස් කරනුයේ මධ්‍යම පළාත් සභාවේ ගරු ආණ්ඩුකාරතුමා වේ.

**13.3.** "කොමිෂන් සභාව" යනුවෙන් අදහස් කරනුයේ මධ්‍යම පළාත් සභාවේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව වේ.

**13.4.** "ප්‍රධාන ලේකම්" යනුවෙන් අදහස් කරනුයේ මධ්‍යම පළාත් සභාවේ ප්‍රධාන ලේකම් වේ.

**13.5.** "ලේකම්" යනුවෙන් අදහස් කරනුයේ මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයා වේ.

**13.6.** "අමාත්‍යාංශ ලේකම්" යනුවෙන් අදහස් කරනුයේ මධ්‍යම පළාත් සභාවේ ක්‍රීඩා විෂය භාර අමාත්‍යාංශයේ ලේකම්වරයා වේ.

**13.7.** "දෙපාර්තමේන්තු ප්‍රධානියා" යනුවෙන් අදහස් කරනුයේ මධ්‍යම පළාත් සභාවේ ක්‍රීඩා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා වේ.

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2019.01.31 දින
අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්

**13.8.** "සතුටුදායක සේවා කාලය" යනුවෙන් අදහස් කරනුයේ ,

(i) රජයේ නිලධරයෙකු විසින් කාර්යක්ෂමව හා අනලස්ව රාජකාරි ඉටු කිරීම් මගින්ද, සමත්විය යුතුව තිබූ කාර්යක්ෂමතා කඩඉම සමත්වීම මගින්ද , සිදුකළ යුතුව තිබූ පත්වීම ස්ථිර කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කිරීම මගින්ද, එම කාලය තුලදී උපයාගත යුතුව තිබූ සියලුම වැටුප් උපයාගෙන ඇත්තා වූ සහ දඬුවම් ලැබිය යුතු වරදක් සිදු නොකරන ලද්දා වූ කාල සීමාවක් වන්නේය.

13.9. " සක්‍රීය සේවා කාලය" යනු ස්වකීය තනතුරට අදාළ වැටුප් ලබමින් සත්‍ය වශයෙන්ම රාජකාරියෙහි යෙදී සිටි සේවා කාලය වේ. රජයෙන් අනුමත ප්‍රසූත නිවාඩු හැර අනෙකුත් සියලුම වැටුප් රහිත නිවාඩු කාලපරිච්ඡේදයන් සක්‍රීය සේවා කාලය සඳහා ගණනය කරනු නොලබන්නේය.

14. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීතිවල දැක්වෙන පොදු කොන්දේසි වලට පරිබාහිර වන්නා වූ කොන්දේසි : අදාළ නොවේ.

15. ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහණය කිරීම :

15.1. මෙම බඳවා ගැනීමේ පරිපාටිය ක්‍රියාත්මක වන දිනට සේවයේ යෙදී සිටින්නන්ට පමණක් අදාළ වේ. දැනට සේවයේ යෙදී සිටින MN 03 - 2016 වැටුප් පරිමාණය යටතේ වැටුප් ලබන දිස්ත්‍රික් ක්‍රීඩා නිලධාරි තනතුරට ස්ථිර පත්වීම් ලබා ඇති නිලධාරීන් මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තුවේ ක්‍රීඩා නිලධාරීන්ගේ ඒකාබද්ධ සේවයේ කළමනාකරණ සහකාර අධි ශ්‍රේණියේ දිස්ත්‍රික් ක්‍රීඩා නිලධාරි තනතුර සඳහා වන නව බඳවා ගැනීමේ පරිපාටියේ විධිවිධාන පරිදි, මධ්‍යම පළාත් ක්‍රීඩා නිලධාරීන්ගේ සේවයේ MN 7 - 2016 වැටුප් පරිමාණය හිමි කළමනාකරණ සහකාර අධි ශ්‍රේණියේ දිස්ත්‍රික් ක්‍රීඩා නිලධාරි තනතුරට අන්තර්ග්‍රහණය කරනු ලැබේ. මෙම අන්තර්ග්‍රහණය අනුව වැටුප් ගෙවීමේදී ආයතන සංග්‍රහයේ VII වන පරිච්ඡේදයේ 4 වන වගන්තියේ සඳහන් විධිවිධාන අදාළ වේ.

15.2. සේවා කාලය ගණන් ගනු ලබන්නේ තනතුරට පත් කරන ලද දිනය පදනම් කර ගෙනය. කෙසේ වුවත් අන්තර්ග්‍රහණය හේතුවෙන් අදාළ තැනැත්තාගේ වැටුප් වර්ධක දිනයෙහි වෙනසක් සිදු නොවිය යුතු අතර එම දිනය අන්තර්ග්‍රහණයට පෙර පැවති වැටුප් වර්ධක දිනය වශයෙන් නොවෙනස්ව ක්‍රියාත්මක විය යුතුය. එසේම වැටුප් පරිවර්තනයේදී අදාළ තැනැත්තා අවසන් වරට ලබමින් සිටි වැටුප් පියවර නව වැටුප් පියවරට අනුරූපී වීම මත ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 4.4 වගන්තිය අනුව ඊළඟ වැටුප් පියවරේ තැබීමද සිදු නොකළ යුතුය.

16. සෑම පත්වීමක් සම්බන්ධයෙන්ම ආයතන සංග්‍රහයේ විධිවිධාන, මුදල් රෙගුලාසි, මධ්‍යම පළාත් මූල්‍ය රීති හා රජය හා / හෝ පළාත් සභාව විසින් කලින් කළට පනවනු ලබන නීතිරීති හා / හෝ රෙගුලාසි අදාළ වේ.

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2019.01.31 දින
අනුමත කරන ලදී.

ආණ්ඩුකාර ලේකම්

**17.** මෙම බඳවා ගැනීමේ පරිපාටියේ විධිවිධාන සලසා නොමැති යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ගරු ආණ්ඩුකාරතුමා විමසා තීරණය කරනු ලැබේ.

මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිර්දේශය : නිර්දේශ කරමු.

| | | |
|---|---|---|
| 01. ගාමිණී දසනායක මහතා | සභාපති | ............................ |
| 02. ජී.ජී.එස්.ඒ. දිසානායක මිය | සාමාජික | ............................ |
| 03. වී. නන්දකුමාර් මහතා | සාමාජික | ............................ |
| 04. ඩබ්.එම්.එස්.ඩී. වීරකෝන් මහතා | සාමාජික | ............................ |
| 05. එච්.එම්. සෝමතිලක මහතා | සාමාජික | ............................ |

දිනය 2019.01.21.......................................

ආණ්ඩුකාර ලේකම්,

2019.01.21................................ දිනැති කොමිෂන් සභා වාර්තාවේ අංක 19/97.......... යටතේ කොමිෂන් සභාව විසින් නිර්දේශ කරන ලද මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තුවේ ක්‍රීඩා නිලධාරීන්ගේ ඒකාබද්ධ සේවයේ කළමනාකරණ සහකාර අධි ශ්‍රේණියේ දිස්ත්‍රික් ක්‍රීඩා නිළධාරි තනතුර සඳහා වන බඳවා ගැනීමේ පරිපාටිය ගරු ආණ්ඩුකාරතුමා ගේ අනුමැතිය සඳහා කාරුණිකව ඉදිරිපත් කරමි.

දිනය:-2019.01.21............................

............................................................

එල්.ඒ. සුජාතා විජේසිංහ
ලේකම්
මධ්‍යම පළාත් සභාවේ
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
(නිල මුද්‍රාව)

එල්. ඒ. සුජාතා විජේසිංහ
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
මධ්‍යම පළාත

අනුමත කරමි / නොකරමි

ජනාධිපති නීතිඥ
මෛත්‍රී ගුණරත්න
ආණ්ඩුකාරවර
මධ්‍යම පළාත.

20 19-01-31
..........................................
ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය

දිනය:-...............................

ඇමුණුම - 01

ක්‍රීඩා ක්ෂේත්‍රයේ ඒකාබද්ධ සේවයේ දිස්ත්‍රික් ක්‍රීඩා නිලධාරි තනතුරට බඳවා ගැනීම
ලකුණු දීමේ පරිපාටිය

| | ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ | කරුණු | උපරිම ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| 01 | අතිරේක සේවා පළපුරුද්ද | මධ්‍යම පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තුවේ ක්‍රීඩා නිලධාරීන්ගේ ඒකාබද්ධ සේවයේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණ (පුහුණුකරු) තනතුරට පත්ව වසර 05 සම්පූර්ණ කළ දින සිට එක් වසරකට ලකුණු 02 බැගින් | 30 |
| 02 | අතිරේක අධ්‍යාපන සහ වෘත්තීය සුදුසුකම් | 1. ක්‍රීඩා ආශ්‍රිත විෂයන් පිළිබඳ හදාරන ලද පාඨමාලා<br>**<u>දේශීය හෝ විදේශීය</u>**<br>i. වසරක් හෝ ඊට වැඩි - ලකුණු 10<br>ii. මාස 06ක් හෝ ඊට වැඩි - ලකුණු 07<br>iii. සති 02කට වඩා වැඩි - ලකුණු 05<br>iv. සති 02ට වඩා අඩු දින 02ට වැඩි - ලකුණු 03<br>2. ක්‍රීඩා හෝ ශාරීරික අධ්‍යාපනය පිළිබඳව හෝ ක්‍රීඩා කළමනාකරණ හෝ පරිපාලනය පිළිබඳ උපාධිය - ලකුණු 15<br>(දේශීය හෝ විදේශීය පාඨමාලා සඳහා ලකුණු ලබාදීමේදී ඉහළම සුදුසුකම් සඳහා පමණක් ලකුණු ලබාදෙනු ලබන අතර උපරිම ලකුණු ලබාදීමේ සීමාව ලකුණු 25 වේ) | 25 |
| 03 | පුහුණුකරු තනතුරේදී දක්වන ලද විශේෂ දක්ෂතාවයන් | 1. පුහුණුකරුවෙකු හෝ පරිපාලකවරයෙකු හෝ සංවිධායකයෙකු හෝ විනිශ්චයකරුවකු ලෙස හෝ වෙනත් නිලතලයක් දරමින්,<br>i. ජාතික මට්ටමින් - ලකුණු 02<br>ii. දකුණු ආසියාතික මට්ටමින් - ලකුණු 05<br>iii. ආසියාතික හෝ පොදු රාජ්‍ය මණ්ඩලීය ලෝක ශූරතා හෝ ඔලිම්පික් තරඟ මට්ටමින් - ලකුණු 07<br>(මෙම එක් එක් සියලුම අවස්ථා සඳහා ලකුණු ලබා දෙනු ලැබේ)<br>2. 230B දරණ පොදු ආකෘතියෙන් ලබා ඇති ප්‍රශංසා සහතික එක් සහතිකයකට ලකුණු 03 බැගින් - ලකුණු 06<br>(උපරිමය සහතික දෙකකට පමණක් ලකුණු ලබාදේ) | 20 |
| 04 | අමතර වෘත්තීය සුදුසුකම් | ජාතික හෝ ජාත්‍යන්තර ජයග්‍රාහක ක්‍රීඩක/ක්‍රීඩිකාවන් බිහි කිරීම (කේවල තරඟ 1,2 හෝ 3 වන ස්ථාන) | 20 |

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2019.01.31 දින
අනුමත කරන ලදී.
Dandel
ආණ්ඩුකාර ලේකම්

| | | |
|---|---|---|
| | 01. ජාතික මට්ටම 1 ස්ථානය - ලකුණු 03<br>2 ස්ථානය - ලකුණු 02 } 05<br>3 ස්ථානය - ලකුණු 01<br><br>02. දකුණු ආසියාතික මට්ටම<br>1 ස්ථානය - ලකුණු 06<br>2 ස්ථානය - ලකුණු 04 } 10<br>3 ස්ථානය - ලකුණු 02<br><br>03. ආසියානු හෝ පොදු රාජ්‍ය මණ්ඩලීය ලෝක ශූරතා තරඟ සඳහා ශ්‍රී ලංකාව නියෝජනය කිරීම<br>1 ස්ථානය - ලකුණු 08<br>2 ස්ථානය - ලකුණු 06 } 15<br>3 ස්ථානය - ලකුණු 04<br><br>04. ඔලිම්පික් තරඟ සඳහා ශ්‍රී ලංකාව නියෝජනය කිරීම - ලකුණු 15<br><br>• කණ්ඩායම් තරඟ සඳහා ඉහත සඳහන් කේවල තරඟ සඳහා නියමිත ලකුණු ප්‍රමාණය ලබාදීමේදී ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ සංඛ්‍යාව පිළිබඳව සලකා බලනු නොලැබේ.<br>• මෙම ක්‍රීඩා ජයග්‍රහණ ක්‍රීඩක/ක්‍රීඩිකාවගේ සහතිකයේ සහතික කළ පිටපතක් හා ක්‍රීඩක/ක්‍රීඩිකාවගේ අත්සන සහිත ලිපියක් මඟින් තහවුරු කළ යුතුය.<br><br>(එක් එක් අනු කොටස් යටතේ සියලු අවස්ථා සඳහා ලකුණු ලබාදෙනු ලබන අතර උපරිම ලකුණු සීමාව ලකුණු 20 වේ) | |
| 05 | සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතා | 05 |
| | **එකතුව** | **100** |

සැ.යු. : ක්‍රීඩා නිලධාරීන්ගේ ඒකාබද්ධ සේවයේ තනතුරකට බඳවා ගැනීමේදී ඉදිරිපත් කළ සහතික සඳහා නැවත ලකුණු ලබා දෙනු නොලැබේ.

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2019.01.31 දින
අනුමත කරන ලදී.

ආණ්ඩුකාර ලේකම්